# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 19 දරන කේ. ආර්. ජ්. විජේසුන්දර ජාතික සහ සේවක සුභසාධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කලේ 2008 මාර්තු මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 මාර්තු මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිළ : රු. 7.00 යි.** තැපැල් ගාස්තුව **: රු. 5.00 යි.**

# 2008 අංක 19 දරන කේ. ආර්. ජී. විජේසුන්දර ජාතික සහ සේවක සුභසාධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2008 මාර්තු මස 26 වන දින]

එල්. ඩී. —ඕ. අයි. එන්. සී. 17/2006

## කේ. ආර්. ජී. විජේසුන්දර ජාතික සහ සේවක සුභසාධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"කේ. ආර්. ජී. විජේසුන්දර ජාතික සහ සේවක සුභසාධන පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව එකී සංගමයට සම්බන්ධ සියලු කටයුතු ඵලදායි ලෙස කරගෙන යාම සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: — පූර්විකාව.

එකී සංගමය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද එකී පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබ හා ඉටු කරනු ලැබ ඇති හෙයින් ද, ඒ සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2008 අංක 19 දරන කේ. ආර්. ජී. විජේසුන්දර ජාතික සහ සේවක සුභසාධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වූ දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) කේ. ආර්. ජී. විජේසුන්දර ජාතික සහ සේවක සුභසාධන පදනමේ සාමාජිකයන් වශයෙන් දැනට සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කේ. ආර්. ජී. විජේසුන්දර ජාතික සහ සේවක සුභසාධන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පැවරිය හැකි වන්නේ ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. — කේ. ආර්. ජී. විජේසුන්දර ජාතික සහ සේවක සුභසාධන පදනම සංස්ථාගත කිරීම.

2—PL002695—2,750 (2007/12)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකා පුරවැසියන් තුළ සහ විශේෂයෙන් සංස්ථාවේ සාමාජිකයන් අතර, විනයගරුක සහ සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීම සඳහා වැඩ කිරීම සහ යෝග්‍ය, ආර්ථික පසුබිම නංවාලිමට කටයුතු කිරීම;

(ආ) සංස්ථාවේ සාමාජිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුභසාධන කටයුතු පුරුකීම;

(ඇ) ස්වාභාවික හෝ ජාතික ආපදාවන් ඇතිවන අවස්ථාවල දී මහජනතාවට උපකාර සැලසීම;

(ඈ) සංස්ථාව විසින් හඳුනාගත් අධ්‍යාපනික ආයතනවල ආර්ථික දුෂ්කරතා මත සුදුසුකම් ලත් සිසුන්ට ත්‍යාග, සහතික, ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සහ වෙනත් ආධාර සැපයීම;

(ඉ) ඌන සංවර්ධිත පාසල් සඳහා විශේෂයෙන් නුගවෙල මධ්‍ය මහා විද්‍යාලය සඳහා අධ්‍යාපනික සහ ක්‍රීඩා කටයුතුවලට දායකත්වය සැපයීම සහ ගොඩනැගිලි ඉදිකිරීම සහ වෙනත් පහසුකම් සැපයීම;

(ඊ) සංස්ථාවේ සාමාජිකයන්ගේ බාලවයස්කාර දරුවන් සඳහා සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදලක් මූලික තැන්පතුවක් ලෙස යොදා ඉතිරි කිරීමේ ගිණුම් ආරම්භ කිරීම;

(උ) සංස්ථාවේ සාමාජිකයන්ගේ පවුල්වල සිදුවන උත්සව කටයුතු ආදිය සඳහා ඔවුන්ට මූල්‍යමය සහ වෙනත් උපකාර සැලසීම;

(ඌ) සංස්ථාවේ සාමාජිකයන්ගේ නිවාස අවශ්‍යතා සඳහා සංස්ථාවේ වත්කම් මත ඇප තබා බැංකු ණය ලබා දීමට ගිවිස ගැනීම;

(එ) සංස්ථාවේ සාමාජිකයන් සඳහා විශ්‍රාම යෝජනා ක්‍රමයකට දායක වීම,

(ඒ) විශ්‍රාමික නිවාස පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ ඒවායේ මූලික අවශ්‍යතාවයන්ට දායකත්වය සැපයීම;

(ඔ) සංස්ථාවේ සාමාජිකයන්ගේ පවුල්වල ප්‍රයෝජනය පිණිස ස්වයං රැකියා සහ වෘත්තිය පුහුණුවීම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම ;

(ඕ) යම් ජාති ආගම් භේදයකින් තොරව ශ්‍රී ලාංකිය පුරවැසියන්ට ජේවය කිරීම සහ සෞභාග්‍ය පිරි ජාතියක් ඇති කිරීමට සහාය වීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කළමනාකරණ සහ පරිපාලන කටයුතු මේ පනතේ විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු අතර, සභාපති, උපසභාපතිවරු දෙදෙනකු, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික, උපභාණ්ඩාගාරික සහ යම් කමිටු සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු ''සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියට එරෙහිව කුමක් සඳහන් වුව ද, පදනමේ නිර්මාතෘවරයා සහ විජය සමූහ ව්‍යාපාරයේ ප්‍රධානියා වන කේ. ආර්. ජී. විජේසුන්දර මහතා සභාවේ පළමු සභාපතිවරයා විය යුතු අතර, ජීවිත කාලය දක්වාම ඒ තනතුර දැරිය යුතු ය.

(3) (1) වන උපවගන්තියට එරෙහිව කුමක් සඳහන් වුව ද, කේ. ආර්. ජී. විජේසුන්දර මහතා මියයාමෙන් පසුව, මහුගේ බිරිඳ වන එන්. පී. ඩබ්. ජී. විජේසුන්දර මහත්මිය ජීවතුන් අතර සිටී නම් සහ ඔහුගේ අනුප්‍රාප්තිකයා සභාවේ සභාපතිවරයා ලෙස, ජීවිතාන්තය දක්වා ඒ ධූරය දැරිය යුතු ය.

(4) මේ පනත ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ ධූර දරන්නා වූ පදනමේ සභාවේ සාමාජිකයන්, සංස්ථාවේ සභාවේ පළමු සාමාජිකයන් විය යුතු අතර, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි සභාව තෝරා පත්කර ගන්නා තෙක් ධූරය දැරිය යුතු ය.

සංස්ථාවේ බලතල.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ අරමුණු හෝ පහත දැක්වෙන බලතල ඇතුළුව අරමුණුවලින් කිසිවක් ප්‍රවර්ධනය කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ අභිමතය පරිදි වූ යම් සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාවේ යෙදවීමට, සංස්ථාවට බලතල තිබිය යුතු ය:—

(අ) සංස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට සහ අන්‍යාකාරයකින් ලබා ගැනීමට;

(ආ) අරමුදල් නැංවීම සහ මුදල් හෝ වෙනත් ආකාරයෙන් වූ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාරගැනීමට;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළහැකි සාධන පත්‍ර පෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගණුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ කිසියම් බැංකුවක ගිණුම් ආරම්භ කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ ඒ ගිණුම් වසා දැමීමට;

(ඈ) සංස්ථාවේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් මණ්ඩලය විසින් සුදුසු යයි නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් සේවයට පත් කිරීමට, සේවයේ යෙදවීමට, සේවයෙන් අස්කිරීමට හෝ සේවය අත්හිටුවීමට සහ ඔවුන් පිළිබඳ විනය පාලන ක්‍රියාත්මක කිරීමට සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට;

(ඊ) සංස්ථාවේ කාර්යයන් සඳහා සේවක පිරිස ශ්‍රී ලංකාව තුළ හෝ විදේශ රටවල පුහුණු කිරීමට;

(උ) සංස්ථාවේ පරමාර්ථ නිසි ආකාරයෙන් සහ ඵලදායී ලෙසින් කරගෙන යාම සඳහා අවශ්‍ය හෝ උචිත සියලු වෙනත් ක්‍රියා සහ දේ කිරීමට.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින් යම් සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් වීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම

(ආ) පදනමේ නිලධරයන් පත් කිරීම හෝ ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ නිලධරයන්ගේ බලතල, කර්තව්‍ය සහ චර්යාව;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කර්තව්‍ය සහ කාර්ය, නියම සහ කොන්දේසි;

(ඈ) සංස්ථාවේ රැස්වීම් කැඳවීමේ දී හෝ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒවායේ පුරප්පාඩු පිරවීම, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම් සඳහා ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම ;

(ඉ) පදනමේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් රැස්වීමක දී සහ යම් ආකාරයකින් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් ලෙස සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එයට එකතු කිරීමක් හෝ පරිච්ඡින්න කිරීමක් කළ හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සියලු අවස්ථාවල දී සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

7. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "විජේසුන්දර පදනම භාර අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් සංස්ථාවට තිබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ අරමුදලට සහාව වෙත ලැබී ඇති සියලු මුදල් කරණකොටගෙන සංස්ථාව වෙත සහ සංස්ථාවේ ගිණුමට ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ආධාර, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලය, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවේ ආදායම් සහ වියදම්, වත්කම් සහ වගකීම් සහ සංස්ථාවේ සියලු ගණුදෙනු පිළිබඳ නියි ගිණුම් තැබීමට සංස්ථාව විසින් සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සභාව විසින් පත්කරන ලද සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එම ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇත්තා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී ව්‍යාපාරික ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ පාලක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් තමා සතුව ඇත්තා වූ ද ගණකාධිකාරී ව්‍යාපාරයක් අදහස් වේ.

පදනම විසින් ගෙවිය යුතු හෝ පදනමට අය විය යුතු ණය.

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංස්ථාව විසින් ගෙවිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ ලැබිය යුතුව තිබුණු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

10. සංස්ථාවේ ණය සහ වගකීම්වලින් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා සංස්ථාවට කලින් කලට අයවිය යුතු පරිදි වූ යම් සාමාජික ගාස්තු ප්‍රමාණයක් ඉක්මවා යන කිසිදු දායක මුදලකට සංස්ථාවේ කිසිදු සාමාජිකයකු යටත් නොවිය යුතු ය.

*සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.*

11. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම්, පියවීමෙන් පසු, කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් දේපළක් හෝ ආදායමක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.*

12. සංස්ථාවේ සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් මවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

13. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1.160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.